


**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.**

# සන්නිවේදනය

## උපකාරක සම්මන්ත්‍රණය -2017

**සැලකිය යුතුයි**

(i). **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii). **1 සිට 40 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න**
(iii). **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න**

---

1 මානව සන්නිදෙනයේ ආරම්භය සිදු වූවා යැයි සැලකෙන්නේ,
(1) ප්‍රාථමික සන්නිවේදන ක්‍රම ගොඩනැගීමත් සමගම ය
(2) ප්‍රාථමික මානවයා සිතන්නට පටන් ගත් දා සිට ය
(3) තම කටහඬ මගින් අදහසක් ප්‍රකාශ කරන්නට මානවයාට හැකි වූ දා සිට ය
(4) අදහස් ප්‍රකාශ කිරීම නිර්මාණාත්මකව සිදු කිරීමට මානවයා පටන් ගත් දා සිට ය

2 ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා අතින් බිහි වූ ගුහා චිත්‍ර සම්බන්ධයෙන් පිළිගත හැකි අදහස වන්නේ,
(1) තමන්ට ආවේනික කථන භාෂාවක් ඇති කර ගැනීමේ පදනමක් බිහි විය
(2) විවිධ හඬ රටා මත ශබ්ද කලාවේ වර්ධනයක් ඇති වේ
(3) විවිධ රූප නිර්මාණාත්මක ලේඛන සංකේත බවට හැරවීම සිදු විය
(4) පණිවිඩයක් හෝ අදහසක් තවත් අයෙකුට ලබා දීම ඇරඹුණි

3 ශබ්ද හෝ රූපය සංඥා තරංග බවට පත් කෙරෙන සන්නිවේදන ක්‍රියාවලියක් විග්‍රහ කරන ආකෘතිය වන්නේ ,
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය
(2) සරල ගුවන් විදුලි ආකෘතිය
(3) ෂැනොන් හා වීවර් ආකෘතිය
(4) ඉහත කිසිදු ආකෘතියක් නොවේ

4 සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන මූලිකාංග කිහිපයක් පහත දක්වේ
A. ආකේතිකරය D. සන්දේශ මූලාශ්‍රය
B. සන්නිවේදකයා E. ග්‍රාහකයා
C. බලපෑම F. සම්ප්‍රේෂණය
ඉහත මූලිකාංග අතරින් ලැස්වෙල් ආකෘතියේදි විග්‍රහ වන්නේ,
(1) A C හා E ය (2) B C හා E ය (3) C D හා F ය (4) A E හා F ය

5 සන්නිවේදනයෙන් ඉටු කරන සමාජානුයෝජනය කාර්යයට වඩාත් ගැලපෙන්නේ,
(1) තම කෑම මේසයේ පුරුදු ඉගෙනීම (2) පෝය දිනයට පන්සල් යාම
(3) දෙමාපියන්ට වැද නින්දට යාම (4) ඉහත සියල්ලම අයත් වේ

6 පංචේන්ද්‍රියන්ගෙන් ලැබෙන සංඥා ග්‍රහණය කරගෙන මනසින් ඒවා අර්ථවත් කර ගැනීමේ ක්‍රියාවලිය,
(1) සන්නිවේදනයයි (2) විකේතිකරයයි (3) ආකේතිකරයයි (4) සංජානනයයි

7 නවීන ගොවිතැන් ක්‍රම පිළිබදව ගැමියන් දැනුවත් කිරීමේ දේශනයට පැමිණ සිටි දේශකයා යොදා ගත් භාෂා රටාව ගැමියන්ට නොතේරුණි. එය,
(1) මාධ්‍ය සාක්ෂරතා බාධයකි (2) මාධ්‍ය බාධයකි
(3) මාධ්‍ය මෙන්ම තාක්ෂණික බාධකයකි (4) අර්ථ බාධකයකි

8 අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන මෙවලම් වන්නේ,
(1) දුරකථනය, ෆැක්ස් යන්ත්‍රය, විද්‍යුත් තැපෑල
(2) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය, දුරකථනය, ෆැක්ස්
(3) මයික්‍රෆෝනය, මෙගා ෆෝනය, දුරකථනය
(4) අන්තර්ජාලය, දුරකථනය, විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය

9 ශිෂ්‍යයෙකුගේ පිළිතුරු පත්‍රයක වාචික සන්නිවේදනයට අයත් නිපුණතා මෙසේ දක්වා තිබුණි
A උච්චාරණ ශෛලිය
B අර්ථවත් බව
C උචිත බව
මේ අතුරින් පිළිගත හැක්කේ,
(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A, B හා C යන සියල්ල ම

10 තිලකසේන අනතුරට පත් වූ පුවත සවස් වන විට ප්‍රදේශය පුරා පැතිර ගොස් තිබුණි මේහිදි වඩාත් ප්‍රමුඛව ක්‍රියාත්මක වී යැයි සිතිය හැකි සන්නිවේදන ස්වරූපය වන්නේ
(1) වාචික හා අවාචික සන්න්වේදනය
(2) වාචික හා අවිධිමත්
(3) ශ්‍රව්‍ය හා විධිමත් සන්නිවේදනය
(4) ශ්‍රව්‍ය හා වාචික සන්නිවේදනය

11 අවාචික සන්නිවේදනයේ පාරිසරික සාධකවලට අයත්වන අංග පමණක් ඇතුළත් වරණය තෝරන්න
(1) ස්පර්ශය, ගන්ධය, ඉරියව්ව
(2) නිවසේ සැලැස්ම, බිත්තිවල වර්ණය, ගෘහ උපකරණ
(3) කට හඬේ රිද්මය, හඬේ වේගය, හඬේ උස් පහත් බව
(4) පෞද්ගලික අවකාශය, සහෘද අවකාශය, සමාජීය අවකාශය

12 සිය නිවසට යන මාවතේ නිවසක පෙර දින රැයෙහි කඩුපුල් මලක් පිපුණු බව, වරංගා තම පන්තිභාර ගුරුතුමියට පැවසුවා ය. මෙසේ ප්‍රකාශ කිරීම සන්නිවේදනාත්මක ව විමසූ විට එය,
(1) තොරතුරකි (2) ඔපාදූපයකි (3) ප්‍රවෘත්තියකි (4) සිද්ධියකි

13 A. පිටු 49කට නොඅඩු වාර සඟරා හෝ මුද්‍රිත කඩදාසි ගොනුව ................ ක් ලෙස සැලකේ.
B. මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති , වෙළෙඳ දැන්වීම්, සාහිත්‍ය සම්බන්ධ කරුණු හා අනෙකුත් අංග ඇතුළත් ව දිනපතා හෝ සතිපතා පළ කරන මුද්‍රිත ස්වරූපය, ................ වේ.
C. යම්කිසි තොරතුරක් පිළිබඳ ව අදාළ පුද්ගලයන් දැනුම්වත් කිරීම සඳහා ප්‍රසිද්ධ ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම ................ යි.
D. යම් ක්ෂේත්‍රයක් අරමුණු කර ගෙන හෝ යම් පාඨක පිරිසක් ඉලක්ක කර ගෙන නිශ්චිත කාලසීමාවල දී පළ වන, කෙටි ලිපි සහ රූපසටහන් සහිත ප්‍රකාශනය, ................ යි.

ඉහත ප්‍රකාශවල හිස්තැන් සඳහා සුදුසු වචන අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) පොත, සඟරාව, පෝස්ටරය, පුවත්පත (2) පොත, පුවත්පත, පෝස්ටරය, සඟරාව
(3) පොත, සඟරාව, පෝස්ටරය, පුවත්පත (4) පොත, පුවත්පත, සඟරාව, පෝස්ටරය

* 14 සිට 16 දක්වා පිළිතුරු ලබා දීම සඳහා පහත දක්වා ඇති පුද්ගල ඡායාරූප උපයෝගී කර ගන්න.



A B C D E

14 නිහඬ සිනමාවේ සුප්‍රසිද්ධ එංගලන්ත නාට්‍යකරුවා ,
(1) A ය (2) C ය (3) D ය (4) E ය

15 එකිනෙකට දුරින් පිහිටි ස්ථාන විදුලි සංදේශ රැහැන් පද්ධතියක් මගින් සම්බන්ධ කොට කිසියම් ප්‍රමිතියකට අනුව සකස් කළ කෙටි හා දිගු විදුලි සංඥා ඔස්සේ සම්ප්‍රේෂණය කිරීම මගින් කාර්යක්ෂම ලෙස පණිවිඩ හුවමාරු කර ගත හැකි බව සොයා ගත්තේ,
(1) A ය (2) B ය (3) C ය (4) E ය

16 ප්‍රථමයෙන් ම ලතින් ව්‍යාකරණය හා බයිබලය මුද්‍රණය කළ පුද්ගලයා,
(1) A ය (2) B ය (3) D ය (4) E ය

17 මැපික් ලන්තෑරුම වේගයෙන් ව්‍යාප්ත වූයේ,
(1) 16 සියවස තුළ දී ය (2) 17 සියවස තුළ දී ය
(3) 18 සියවස තුළ දී ය (4) 19 සියවස තුළ දී ය

18 සිට 19 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වා ඇති සන්නිවේදන මූලිකාංග ප්‍රයෝජනයට ගන්න

| | | | |
|---|---|---|---|
| A ආකේතිකරය | B පණිවිඩය/සන්දේශය | C නාලිකාව/මාධ්‍යය | D සන්නිවේදකයා |
| E සන්නිවේදන මූලය | F සම්ප්‍රේෂණය | G ග්‍රාහකයා | I බලපෑම |

18 ඉහත සඳහන් සන්නිවේදන මූලිකාංග අතරින් හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියට අයත් මූලිකාංග පිළිවෙළින් සඳහන් වන්නේ,
(1) E,B,C,G,I ය (2) A,D,B,C,G ය
(3) E,F,B,C,G ය (4) D,B,C,G,I ය

19 විකාශනය කළ යුතු සංදේශය සංඥා හෝ සංකේත බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සිදු කරන්නා,
(1) A හා F ය (2) E හා F ය (3) A හා D ය (4) D හා G ය

20 කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීම සහ ප්‍රතිබිම්බය සටහන් කර ගැනීම,
(1) අනාවරණයයි (2) මානනයයි (3) නාභිගත කිරීමයි (4) යුහුම් කිරීමයි

21 වාග් කෝෂය පුළුල් කොට ගෙන, කියවීමට මෙන් ම වාක්‍ය රටා නිර්මාණය කිරීමට ඉගෙන ගැනීමෙන් විවිධ අදහස් තොරතුරු, ප්‍රවෘත්ති තමන්ගේ දැනුමට එක් කර ගැනීමට හේතු වන්නේ,
(1) ගුවන්විදුලියයි (2)රූපවාහිනියයි
(3) පුවත්පතයි (4) සඟරාවයි

22 නව කතාවක චරිතයක් ආත්ම කථනයේ යෙදේ නම්; එහි දී භාවිත වන සන්නිවිදන වර්ගය;
(1) පුද්ගලාන්තර සන්නිවේදනයයි
(2) සමූහ සන්නිවේදනයයි
(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි
(4) ජන සන්නිවේදනයයි

23 අවාචික සන්නිවේදනය වඩාත් ම ඉස්මතු වී පෙනෙන්නේ;
(1) සංඥා එළි නිකුත් කරන විටක දී
(2) පුවත්පත් දැන්වීමක දී
(3) ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රචාරයේ දී
(4) දෙදෙනෙකු අතර සුහද කතාබහක දී

24 පන්තිකාමරය තුළ මාධ්‍ය උපකරණ භාවිතය අවශ්‍ය වන්නේ;
(1) විවිධ රූප සටහන් හා ඡායාරූප ආදිය පහසුවෙන් පෙන්වීමට ය
(2) ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට ය
(3) කථනය සමඟ දෘෂ්‍ය මාධ්‍ය යොදා ගැනීමට ය
(4) ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය පහසු කර ගැනීමට

25 උපරි ප්‍රක්ෂේපණ (ධ්‍යජ) යන්ත්‍රය හා බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය අතර පවතින ප්‍රබල වෙනස්කමක් වන්නේ,
(1) උපරි ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විදුලිය අවශ්‍ය අතර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විදුලිය අවශ්‍ය නොවේ
(2) උපරි ප්‍රක්ෂේපණ යන්ත්‍රයට පරිගණකය අවශ්‍ය නොවන අතර බහු මාධ්‍ය ප්‍රක්ෂේපණයට පරිගණකය අවශ්‍ය වේ
(3) උපරි ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විනිවිදක පත්‍ර අවශ්‍ය අතර බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ඉටිපත් අවශ්‍ය වේ.
(4) උපරි ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විදුලිය අවශ්‍ය නොවන අතර, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විදුලිය අවශ්‍ය වේ.

26 අන්තර්ජාල විද්‍යුත් තැපැල් ලිපිනයක් (E-mail Address) සකස් කර ගැනීමට ඔබගේ මිතුරෙකුට අවශ්‍ය වී තිබේ. ඒ සඳහා කොපමණ මුදලක් වැයවන්නේදැයි ඔබගෙන් විමසයි. ඔබ ලබා දිය යුතු නිවැරදි පිළිතුර වන්නේ;
(1) විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කර ගැනීමට මුදල් ගෙවීම අනවශ්‍යයි
(2) අන්තර්ජාලයට පිවිසීමෙන් නොමිලේ විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගත හැක
(3) සුළු මුදලක් වැය කිරීමෙන් විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගත හැක
(4) විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගැනීමට විශාල මුදලක් ගෙවිය යුතුය

27 මුද්‍රිත; ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය - දෘෂ්‍ය මාධ්‍යවල දැකිය හැකි ආකේතකාරකයින් හැඳින්විය හැකි අනුපිළිවළ වන්නේ;
(1) රචකයා; කථකයා හා ප්‍රේක්ෂකයා
(2) සංස්කාරක; ශ්‍රාවකයා හා නළුවා
(3) පාඨකයා; ශ්‍රාවකයා හා ප්‍රේක්ෂකයා
(4) කර්තෘ; නිවේදකයා හා ඉදිරිපත් කරන්නා




**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.**

# සන්නිවේදනය

28 නූතන දෘශ්‍ය මාධ්‍ය පමණක් අඩංගු වරණය වන්නේ;
(1) මාර් සංඥා, පොත් පිංච, පෝස්ටර්, අත්පත්‍රිකා (2) අත්පත්‍රිකා, පෝස්ටර්, ෆෝල්ඩර්ස්, ගින්දර
(3) බිත්ති සටහන්, ධාරා සටහන්, චිත්‍ර, මාර්ග සංඥා (4) චිත්‍ර, ගස්වල කැපූ කට්ටා, පොත් පිංච, දුම්ගුලි

29 අනෙකුත් මාධ්‍ය හා සැසඳීමේ දී මුද්‍රිත මාධ්‍යයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නොවන්නේ;
(1) පරිගණකය හා තාක්ෂණික පහසුකම් අවශ්‍ය වීමයි
(2) පාඨකයාට අභිමත පරිදි භාවිත කළ හැකි වීමයි
(3) සංරක්ෂණය කිරීම සඳහා තාක්ෂණය අවශ්‍ය වීමයි
(4) භාෂා සාක්ෂරතාව අවශ්‍ය වීමයි

30 යම්කිසි කාර්යාලයක වෙබ් අඩවියක් පවත්වා ගෙන යාමේ වාසියක් වීමට **අවම ඉඩක්** ඇත්තේ
(1) කාර්යාල තොරතුරු යාවත්කාලීන කිරීම
(2) කාර්යාල කාර්යයන් සමාජයට විවෘත කිරීම
(3) කාර්යාල තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කර ගත හැකි වීම
(4) කාර්යාල තොරතුරු වේගවත් ව ලබා දීමට හැකි වීම

31 ගුවන්විදුලි මාධ්‍යයට අයත් **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) ක්ෂණ භංගුර නොවන මාධ්‍යයක්
(2) දෘශ්‍ය නොවන මාධ්‍යයකි
(3) වැඩි බලපෑමක් කළ හැකි වැඩි වියදම් නොවන මාධ්‍යයකි
(4) පරිකල්පනීය මෙන් ම ප්‍රමාද නොවන ජන මාධයකි

32 වාර්තා කථන වැඩසටහනක් සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශය වන්නේ,
(1) යම් සිදුවීමක් සජීවීව විස්තර කථනය කිරීමයි
(2) යම් සිදුවීමක් ඇති වූ අවස්ථාවේ ඇති සැබෑ සම්බන්ධතා හා කතා යනාදිය එක් කර ගනිමින් තොරතුරු ගෙන ඒමයි
(3) ගංවතුර, නායයාම්, සුනාමි වැනි අවස්ථා ඇති වීමට පෙර සිදු කරන වැඩසටහනකි
(4) යම් සිදුවීමක් විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ විස්තර කිරීමයි

33 වරංගා සාහිත්‍ය සමිතියේදී විවිධ මාධ්‍ය මෙවලම් භාවිත කරමින් සිදු කළ දේශනය වැඩි දෙනෙක් අසා සිටි එකක් නොවේ. එසේ වීමට අවම ඉඩක් ඇත්තේ,
(1) දේශනය ග්‍රාහකයින්ට අදාළ නොවීම
(2) හඬ සියලු දෙනාට නොඇසී යාම
(3) කතාව අතර විදුහල්පතිවරයා දේශන ශාලාවට පැමිණීම
(4) වෙනත් බාහිර බාධක ඇතිවීම

34 ආයතනයක චක්‍රලේඛ මගින් නිල දැන්වීම් පවත්වා ගැනීම සහ යෝජනා පෙට්ටි පවත්වාගෙන යාම සාමාන්‍ය සිද්ධියකි. මෙම ක්‍රියාවලි දෙකෙහි සන්නිවේදන අනුපිළිවෙළ සටහන් වී ඇති නිවැරදි වරණය වන්නේ,
(1) පහළින් ඉහළට හා පහළින් පහළට සන්නිවේදනය කිරීමයි
(2) ඉහළින් පහළට හා පහළින් ඉහළට සන්නිවේදනය කිරීමයි
(3) ඉහළින් ඉහළට හා ඉහළින් පහළට සන්නිවේදනය කිරීමයි
(4) පහළින් පහළට හා ඉහළින් පහළට සන්නිවේදනය කිරීමයි

35 සිය කුඩා දියණියට පියා විසින් කතන්දරයක් කියා දෙමින් සිටින අවස්ථාව හැඳින්විය හැකි සන්නිවේදන ප්‍රභේදය වන්නේ,
(1) වාචික සන්නිවේදනය (2) ලිඛිත සන්නිවේදනය
(3) පුද්ගලාන්තර සන්නිවේදනය (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

36 පැරණි මුද්‍රණ ක්‍රමයට හා නූතන මුද්‍රණ ක්‍රමයට මංහසර විවර කළ රටවල් වන්නේ,
(1) ඇමරිකාව හා ඉන්දියාව (2) ඇමරිකාව හා මහා බ්‍රිතාන්‍යය
(3) චීනය හා ජපානය (4) චීනය හා ජර්මනිය

37 පහත ප්‍රකාශ අතුරින් පරිගණක භාවිතය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වේගයෙන් තොරතුරු හුවමාරු කළ හැකි ය.
(2) අත්අකුරින් ලියනවාට වඩා පැහැදිලි ව හා නිරවුල්ව ඉදිරිපත් කළ හැකි ය.
(3) සෝදුපත් බැලීම අපහසු විය හැකි ය.
(4) වැය වන මුදල අවම විය හැකි ය.

38 පුවත්පතක අඩංගු කරුණු අතරින් 60%ක ඉඩකඩ ප්‍රමාණයක් වෙන් වන්නේ,
(1) දැන්වීම් සඳහා ය. (2) ඡායාරූප සඳහා ය.
(3) දැන්වීම් හැර සෙසු තොරතුරු සඳහා ය (4) පුවත් හා අනුග්‍රාහක දැන්වීම් සඳහාය

39 ජන මාධ්‍ය සම්බන්ධයෙන් පළ වූ පහත වාක්‍ය අතරින් නිරවද්‍ය නොවූ වාක්‍ය තෝරන්න.
(1) තෝරාගත් සමහර ප්‍රවෘත්ති ප්‍රකාශනයෙන් වැළක්වීම සඳහා නිසි බලධරයෙකු පත් කරයි.
(2) සෑම පුවත්පතක් ම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය තුළ ලියාපදිංචි කළ හැකි ය.
(3) ගුවන් විදුලි ප්‍රවෘත්ති පිටපතක විස්තරාත්මක සංඛ්‍යා දත්ත ඇතුළත් නොකළ යුතු ය.
(4) රූපවාහිනී මාධ්‍ය තුළ භාෂාවට වඩා රූපයට ප්‍රබල ස්ථානයක් හිමි නොවිය යුතු ය.

40 සිනමා මාධ්‍ය භාවිතය පිළිබඳ ව ශිෂ්‍යාවන් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.
අමාලි- සිනමාවේ ප්‍රධාන සිද්ධාන්තය තමයි, දෘෂ්ටියේ අඛණ්ඩතාව සංකල්පය.
නිමාලි- සිනමාවේදී ප්‍රධාන වන්නේ, දුර දුෂ්ටිකත්වයයි.
විමාලි- දුර රූප, සමීප රූප හා අති සමීප රූප ආදී රූප රාමු රැසක් එකට ගලපලයි චිත්‍රපටය නිර්මාණය කරන්නේ.
සොනාලි- ඒ උනාට සිනමාව සම්ප්‍රේෂණ මාධ්‍යයක්.
ඉහත ශිෂ්‍යාවන් ඉදිරිපත් කළ අදහස් අතුරින් සිනමාව සම්බන්ධ නිවැරදි තොරතුරු දැක්වූයේ,
(1) අමාලි හා සොනාලි පමණි. (2) නිමාලි හා විමාලි පමණි.
(3) විමාලි හා සොනාලි පමණි. (4) විමාලි හා අමාලි පමණි.

## සන්නිවේදනය II

- **පළමු වැනි ප්‍රශ්නය** හා තෝරා ගත් **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළු ව **ප්‍රශ්න 5කට පමණක්** පිළිතුරු සපයන්න.
- **පළමු වැනි** ප්‍රශ්නයට **ලකුණු 20ක්** හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 10 බැගින්** හිමි වේ.
- පළමු ප්‍රශ්නයේ සෑම අනු කොටසකට ම ලකුණු 2 බැගින් හිමි වන අතර අනෙකුත් ප්‍රශ්නවල අනු කොටස්වලට පිළිවෙළින් (1)ට **ලකුණු** 01, (2)ට **ලකුණු** 02, (3)ට **ලකුණු** 03, (4)ට **ලකුණු** 04 බැගින් වන සේ **ලකුණු** 10ක් පිරිනැමේ.


01. සමරදිවාකර ගුරුතුමිය කොත්මලේ වැව්පිටිය මහා විද්‍යාලයට පැමිණි නවක ගුරුවරියකි. ඇය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයභාර ගුරුතුමිය ලෙසින් වැඩබාර ගත් අතර, ඒ පිළිබඳ ව කොත්මලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ලිඛිතව දැනුම් දීමට අදාළ ලේඛන සකසමින් සිටින්නී ය.
(1) සමරදිවාකර ගුරුතුමියට අදාළ ලේඛනය පරිගණකයෙන් සකස් කිරීමට අවශ්‍ය වන උපකරණ 4ක් නම් කරන්න.
(2) වැඩබාර ගැනීමෙන් පසු, ඒ බව නවසීලන්තයේ සේවය කරන ඇගේ සැමියාට ක්ෂණික ව දැනුම් දිය හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
(3) පන්තිකාමර ඉගෙනුම් කාර්යයේදී ඇය වරින් වර සිසුන්ගේ ඇස් දෙස බලමින් සිය දේශන සාකච්ඡාව සිදු කරන ලදි. එම ක්‍රියාවලියට අදාළ සංකල්පය නම් කර, එහිදී යොදා ගත හැකි වෙනත් උපක්‍රමයක් දක්වන්න.
(4) පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම්වලදී ජනමාධ්‍ය භාවිත කළ හැකි ආකාරය උදාහරණයක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න
(5) සමරදිවාකර මහත්මියට ඇය සේවය කරන පාසලේ සෙසු ගුරු මණ්ඩලය සමග සුහදව කටයුතු කළ යුතු බව විදුහල්පතිතුමා දැන්වූ අතර, එහිදී ඇයට භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් දක්වා, එකක් යොදා ගත හැකි අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න
(6) පසුදා උදෑසන හමුවේදී ඇය සිසුන්ට හඳුන්වා දී, කෙටි දෙසුමකට ද ආරාධනා කළ හෙයින් අපූරු කතන්දරයක් පවසා එහි ආදර්ශය පැහැදිලි කළේ සුප්‍රසිද්ධ දේශකයෙකු විලසිනි. එහිදී පාසලේ ශබ්ද විකාශනය යන්ත්‍රය ඔස්සේ සිදු කළ කෙටි දෙසුම මැනවින් පවත්වා ගැනීමට ඇ භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි කුසලතා දෙකක් සඳහන් කරන්න
(7) සමරදිවාකර මහත්මියගේ ඉහත කෙටි දෙසුම තුළ දක්නට ලැබෙන සන්නිවේදන මූලිකාංග හතරක් අවස්ථාව සමග ලියන්න
(8) පාසලේ මාසික පුවත්පතේ කටයුතු ඇය වෙත බාර දුන් අතර, එය අන්තර්ජාල පුවත්පතක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කරයි. අන්තර්ජාල පුවත්පත හා මුද්‍රිත පුවත්පත අතර වෙනස්කම් දෙකක් ලියන්න
(9) පුවත්පත් මාධ්‍ය තුළ ඇති විය හැකි අර්ථ බාධාවක් හා මාධ්‍ය බාධාවක් සඳහන් කර, සන්නිවේදන බාධා අවම කර ගත හැකි ක්‍රමයක් යෝජනා කරන්න
(10) පුවත්පතක තොරතුරු සම්පාදනයේදී සැලකිය යුතු කරුණු දෙකක් දක්වා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න

02. ඩී.පෙරේරා මහතා එක්තරා ජාතික පුවත්පතක පාර්ලිමේන්තු වාර්තාකරුවා ය.
(1) ඩී. පෙරේරා මහතාට ලබා දී ඇති බීට්ටුවාර්තාකරණ ක්ෂේත්‍රය කුමක් ද?
(2) පෙරේරා මහතා පුවත් වාර්තාකරණයේදී බහුල වශයෙන් ආයතනික මූලාශ්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. 'ආයතනික මූලාශ්‍රය' යන්න කෙටියෙන් හඳුන්වා, ආයතනික මූලාශ්‍ර දෙකක් නම් කරන්න.
(3) ඔහු තෝරා ගන්නා ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න
(4) පුවත්පත් හා ගුවන්විදුලි මාධ්‍යයේ භාෂා භාවිතයේ දී දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.


03 නන්දිත ඡායාරූප ශිල්පියා වීරපුර ගැමුණු විද්‍යාලයේ කලා උළෙල පැවැත් වූ දින ඡායාරූප ගැනීම සඳහා කැඳවා තිබුණු අතර, ඔහු සමග පාසල් ඡායාරූප සංගමයේ සිසුන් තිදෙනෙක් ද එදින ඡායාරූප ගන්නා ලදි.
(1) ඔවුන් භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි කැමරා වර්ග දෙකක් නම් කරන්න
(2) එයින් සේයාපට භාවිත කළ කැමරා වර්ගයට සාපේක්ෂව සේයාපට භාවිත නොකළ කැමරාවේ දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් 4ක් නම් කරන්න.
(3) ඡායාරූප පුවත්පත් කලාව සඳහා යොදා ගන්නා ඡායාරූපවල ස්වභාවය අනුව එහි වර්ග තුනක් සඳහන් කර, පුවත්පතක ඡායාරූප භාවිතයෙන් ලැබෙන වාසි තුනක් සඳහන් කෙටියෙන් පැහැදිලි කරන්න
(4) චිත්‍රපට කර්මාන්තයේදී නිශ්චල ඡායාරූප භාවිත කරන අවස්ථා 4ක් දක්වා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න

04 මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රය ජනතාවට වඩාත් සමීප මාධ්‍යයකි.
(1) එදිනෙදා භාවිත කරන සමීපතම මුද්‍රිත මාධ්‍ය ස්වරූප 4ක් නම් කරන්න.
(2) ඉහත ඔබ සඳහන් කළ මුද්‍රිත මාධ්‍ය දෙකක් කෙටියෙන් හඳුන්වන්න.
(3) පුවත්පතක අන්තර්ගත තොරතුරු අඩංගු ආකෘති 3ක් කෙටියෙන් විස්තර කරන්න
(4) පුවත්පත් මාධ්‍යයට සාපේක්ෂව ගුවන්විදුලි මාධ්‍ය තුළ ඉස්මතු වන ප්‍රබලතා හතරක් පැහැදිලි කරන්න

05



1 රූපය



2 රූපය

ඉහත දැක්වෙන්නේ යම්කිසි සන්නිවේදන ක්‍රියාවලීන් දෙකකි.
(1) ඉහත රූප සටහන්වලට අනුව 1 හා 2 රූපවලට අදාළ සන්නිවේදන වර්ගය වෙන වෙනම නම් කරන්න
(2) ඔබ සඳහන් කළ සන්නිවේදන වර්ග අතර පවතින වෙනස්කම් 4ක් සඳහන් කරන්න
(3) පුවත්පතක කර්තෘ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු නම් කර, එම දෙදෙනා ගැන පිළිබඳ කෙටි සටහනක් ලියන්න
(4) පුරවැසිභාවය යන්න හඳුන්වා, රටක යහපැවැත්ම කෙරෙහි පුරවැසියෙකුගේ කාර්යභාරය කරුණු තුනක් යටතේ විස්තර කරන්න

06 වර්තමානයේ සියලු ජනමාධ්‍ය විසින් සමාජය හැසිරවීමේ බලය හිමි කර ගෙන ඇතත් ඒවායෙහි ආරම්භය එක් පුද්ගලයෙකු හෝ සංවිධානයන් මගින් සිදු වී ඇත.
(1) කර්තෘ හිමි පුවත්පතක් හා සංවිධාන හිමි පුවත්පතක් සඳහන් කරන්න
(2) රජයට අයත් ජනමාධ්‍ය ආයතන 2ක් සඳහන් කර, මාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ ඍජු හෝ වක්‍ර මැදිහත්වීම් දෙකක් ලියන්න
(3) පුවත් වාර්තා හා පුවත් ලිපි යනු එකිනෙකට වෙනස් මාධ්‍යයන් ය. පුවත් ලිපියක ලක්ෂණ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(4) මෑත කාලයේ බහුලව යොදා ගන්නා ජංගම දුරකථන භාවිතය හා සම්බන්ධ ආචාරධර්ම 4ක් කෙටියෙන් පැහැදිලි කරන්න

07 වසරේ සාහිත්‍ය සම්මාන හිමි වූ කෘතියක් දොරට වැඩීමේ උළෙලක දී එහි ආරාධිත දේශකයෙකු විසින් සිදු කරන ලද දේශනය අවස්ථාවේ අසන්නන් කිහිප දෙනෙක් සභාවෙන් පිටව ගියහ. තවත් සමහරු එකිනෙකා හා ඝෝෂාකාරී ලෙස කතා කරන්නට පටන් ගත් හෙයින් ඉක්මනින් ම දේශකයා සිය දෙසුම නවතා දැමී ය.
(1) ඉහත සිදුවීමට අනුව එම සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක වීමට හේතු වූ දේශකයාගේ දුර්වලතා දෙකක් දක්වන්න.
(2) අදාළ දේශනය සිදු කරන ලද්දේ සාහිත්‍ය කෘතියෙහි නිර්මාණාත්මක ගුණාංග පිළිබඳව නම්, නිර්මාණයක ගුණාංග හතරක් නම් කර, එකක් පැහැදිලි කරන්න.
(3) කෘතිය හඳුන්වා දීමෙන් පසු එහි සිටි ආරාධිත අමුත්තන් කිහිප දෙනෙකු සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටියේ නම්, කතුවරයාගේ ඡායාරූපය ගැනීම සඳහා කැමරා ශිල්පියා විසින් යොදාගත් කැමරා උපාංග දෙකක් නම් කර ඒවා යොදා ගැනීමට බලපෑ හේතු ලියන්න.
(4) පොත දොරට වැඩීම පිළිබඳ ව හුදු ප්‍රවෘත්තියක් නොව නිර්මාණාත්මක රචනයක් ලෙස ඉදිරිපත් කළ යුතු බව සාහිත්‍ය කතුවරයා පවසයි. ප්‍රවෘත්ති වාර්තාකරණයෙන් නිර්මාණාත්මක රචනය වෙනස් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න